# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 973/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 10/06/2024<br>පැය 0820 | | |

## මාධ්‍ය නිවේදනය

## 01. හෙරොයින් හා පිස්තෝල අවි 02ක් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය

2024.06.09 වන දින රාත්‍රී කාලයේ කැස්බෑව පොලිස් වසමේ කැබැල්ලගහවත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශයහි නිලධාරීන් කණ්ඩායමක් විසින් කාර් රථ දෙකක් පරික්ෂා කර හෙරොයින් සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන්ගෙන් අනාවරණය කර ගත් තොරතුරු මත එම ප්‍රදේශයේ නිවසක් පරික්ෂා කර තවත් මත්ද්‍රව්‍ය හා පිස්තෝල අවි 02ක්, විද්‍යුත් තරාදියක් සොයා ගෙන ඇත. සැකකරුවන් භාරයේ තිබූ මුළු හෙරොයින් ප්‍රමාණය කිලෝග්‍රෑම් 13 ග්‍රෑම් 106ක් වන අතර ඔවුන් සන්තකයේ තිබී හැෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 164ක්ද සොයා ගෙන ඇත. සැකකරුවන් තිදෙනා මත්ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා යොදාගත් කාර් රථ 02කද සමඟ අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24,28 හා 48 වයස් වල පසු වන ගෝනාපොල, වීරවිල හා ගල්වලමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

අත්අඩංගුවට ගත් සැකකරුවන් ඩුබායි රාජ්‍යයේ සිට සැඟව මෙරට මත්ද්‍රව්‍ය ජාවාරම් සිදු කරනු ලබන සැකකරුවෙකුගේ සමීපතමයකු බව අනාවරණය වූ අතර පොලිස් මත්ද්‍රව්‍ය කායීංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**